සියලු ම පහසුකම් සහිත ව පන්තිකාමරවල ඉගෙනීමට අවකාශ සළසමින්, ඉදිරි දහම් පාසල් සැසිවාරය, 2011 සැප්තැම්බර් මැද සිට 2012 මැයි අග දක්වා, මිසිසාගාහි පිහිටි රික්හැන්සන් විදුහලේ දී පැවැත්වේ. ඔබේ දරුවා ද නව වසර සඳහා අද ම ලියාපදිංචි කරන්න.

Dhamma School
West End Buddhist Centre

ඔබේ දරුවන් අප දහම් පාසලට රැගෙන එන ලෙස මෙයින් ඇරයුම් කරසිටිමු. ඒ තුළින් ඔබේ දරුවා දහම් දැනුමින් යුතු ගුණගරුක ශක්තිමත් ආධ්‍යාත්මික බලයකින් යුතු උසස් දරුවෙකු බවට පත්කරලීමේ වටිනා අවස්ථාව මග නොහරින්න.

2011සැප්තැම්බර් 18 දින ආරම්භ වේ.

මිසිසාගා බෞද්ධ විහාරස්ථානයේ

(වෙස්ට් එන්ඩ් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ)

# ඉරුදින දහම් පාසල

මිසිසාගාහි පිහිටි රික්හැන්සන් විදුහලේ දී පැවැත්වේ

ජාත්‍යන්තර වශයෙන් හමුවන තොරතුරු අනුව උතුරු ඇමරිකාවේ පමණක් නොව බටහිර රටවල ද පැවැත්වෙන ශ්‍රී ලාංකික සම්භවයකින් යුතු දහම්පාසල් අතර අප දහම්පාසල ගුණාත්මක ව මෙන් ම සංඛ්‍යාත්මක ව ද විශාල දහම් පාසල බව අනතිමානිව සටහන් කරමු. වර්තමානයේ ද අප දහම් පාසලෙහි ගුණ-දහම් ඉගෙන ගන්නා ශිෂ්‍ය-ශිෂ්‍යාවන් පිරිස තුන්සියයකට(300) අධිකය. අවුරුදු හතරේ (04) සිට දහඅට (18) දක්වා වූ වයස්සීමාවල දරුවෝ මෙහි වෙති. ඒ ඒ වයස්සීමාවලට ගැලපෙන දහම් කොටස් ඇතුළත් විෂය නිර්දේශ යටතේ දරුවන්ට දහම් දැනුම ලැබීමට අවකාශ සළසා ඇත. දහම් දැනුම මෙන් ම ප්‍රායෝගික ආගමික වතාවත් පුහුණුව ද ඊට සමගාමීව සිදුකෙරේ.

## සැළකිය යුතු කරුණු

- සංවිධානාත්මක විෂය නිර්දේශයක් සතු වීම
- බාලාංශ පන්තියේ සිට සිංහල භාෂාවට හුරු වචන සහිත ව දහම් කරුණු ඉගැන්වීම ආරම්භ වීම.
- ඉංග්‍රීසි බසින් උගන්වන, සුදුසුකම් සහිත ගුරුභවතුන් 30 දෙනෙකුන්ගෙන් සමන්විත වීම.
- දහම්පාසලේ ඉගෙන ගන්නා සියලු දරුවන්ට දහම්පාසල පැවැත්වෙන දිනයන්හි අවසානයේ දී විශේෂ සංග්‍රහයක් පැවැත්වේ.
- දහම් පාසල පැවැත්වෙන අතර තුර දරුවන් රැගෙන පැමිණෙන දෙමාපියන් ඇතුළු සියලු වැඩිහිටියන් සියලු දෙනා වෙනුවෙන් සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන විශේෂ ධර්ම සාකච්ඡාවක් සෑම ඉරුදිනක ම ස්වාමීන් වහන්සේ නමකගේ හෝ කිහිප නමකගේ සහභාගිත්වයෙන් සිදුකෙරේ.
- දහම් පසලේ ගුරු භවතුන් සියලු දරුවන් ආදරයෙන් කරුණාවෙන් දහම්පාසල් කාලය තුළ රැක බලාගැනීමට බැඳී සිටී.
- දරුවන්ගේ රැකවරණය වෙනුවෙන් දෙමාපියන්ගේ සහයෝගය ගුරුභවතුන් හට ලබාදිය යුතු වේ.





සියලුම විස්තර සඳහා මෙම අංකට අමතන්න 905-891-8412
E-mail: info@westendbuddhist.com
Web: www.westendbuddhist.com


තෙරුවන් සරණයි.


මිසිසාගා බෞද්ධ විහාරස්ථ දහම්පාසලේ ප්‍රධානාචාර්ය
භික්ඛු සරණපාල (Ph.D)
Buddhist Chaplain, University of Toronto.